# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2367/23 - 2024 ජනවාරි මස 19 වැනි සිකුරාදා - 2024.01.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : MUL/LND/02/ACQ/40.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/2/2011/FR/76.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවයේ විස්තර* :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 271-B, කුඩාපාන ග්‍රාම නිලධාරි වසමට අයත් කුඩාපාන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද 2023.12.07 දිනැති හා අවසාන ගම් පිඹුරු අංක ක.සි. 820412 හි කලාප අංක 03, පත්‍ර අංක 01 හි කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0495 ක් වූ පහත සඳහන් ඉඩම :

01. කැබලි අංක **01**
ඉඩමේ නම: බටේහේන; ඉඩම් විස්තරය: ලඳු කැලය; මුල් හිමිකම්පාන්නා: ඉන්ද්‍රානි කොඩිතුවක්කු; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0495.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2024 අප්‍රේල් මස 29 වැනි දින පෙ.ව. 10.00 ට මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද 2024 අප්‍රේල් මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගනන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

වින්ධ්‍යා ඩී. සමරක්කොඩි,
ප්‍රාදේශීය ලේකම්,
මුලටියන.

2024 ජනවාරි මස 16 වැනි දින,
මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01 - 0181